# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: MF/CG/02 (Cir.)
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2018.10. 10

වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක: 03/2018

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,
රාජ්‍ය බැංකු සහ රාජ්‍ය සමාගම් සභාපතිවරුන්,

**<u>රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය</u>**
**<u>රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කිරීම.</u>**

පරිහරණය කරනු ලබන වාහනවල ලියාපදිංචි අයිතිය නිරවුල් කර ගැනීම 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 යටතේ ලබාදී ඇති උපදෙස් අනුව සිදු කිරීම සියලු ම රාජ්‍ය ආයතනවල වගකීම වේ. එසේ වුව ද, ආයතන අහෝසිවීම හා ඇවර කිරීම හේතුවෙන් එම ආයතන සතුව පවතින වාහනවල ලියාපදිංචි අයිතිය පැවරීම මෙන් ම, අයිතිකරු පිළිබඳ කිසිදු තොරතුරක් නොමැතිවීම වැනි ප්‍රායෝගික ගැටලු මෙම වාහනවල ලියාපදිංචි අයිතිය නිරවුල් කිරීම පිළිබඳව පවතින බව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තා වී ඇත.

02. ඉහත සඳහන් ප්‍රායෝගික ගැටලු පිළිබඳ අවධානය යොමු කරමින් 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 හි 02 (ii) වගන්තිය අනුව එවැනි වාහන දැනට පරිහරණය කරනු ලබන ආයතනයට ලියාපදිංචි අයිතිය ලබා ගැනීමට නොහැකි වන අවස්ථාවල දී, එම වාහනවල ලියාපදිංචි අයිතිය ලබාදීමට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාට හැකිවන පරිදි, වත්මන් පරිහරණකරු විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලීමට යටත්ව මෝටර් වාහන පනත යටතේ වන එම්.ටී.ඒ.06 ආකෘතිය අත්සන් කිරීම කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා විසින් සිදු කරනු ඇත.

(අ) වත්මන් පරිහරණකරු විසින් තමා සන්තකයේ වාහනය පැවති කාල සීමාව පිළිබඳව තහවුරු කිරීම හා එම වාහනය වත්මන් පරිහරණකරු වෙත නීත්‍යානුකූලව පවරා දෙනු ලබන දිනය දක්වා කාලයට වාහනයේ භාවිතය පිළිබඳ සියලු වගකීම් දරන බව තහවුරු කිරීම.

ආ) වාහනයේ පෙර අයිතිය තහවුරු කිරීමට ලියාපදිංචි සහතිකයේ පිටපතක් වත්මන් පරිහරණකරු විසින් ඉදිරිපත් කළ යුතු වේ. ලියාපදිංචි සහතිකය නොමැති අවස්ථාවක දී, වාහනයේ ලියාපදිංචි සහතිකයේ අනු පිටපතක් ලබා දෙන ලෙස මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ට නිර්දේශ කිරීමට (මෝටර් වාහන පනත යටතේ වන මෝ.ප්‍ර.කො. 65 ආකෘතිය අත්සන් කිරීම සඳහා) වත්මන් පරිහරණකරු විසින් කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම.

ඇ) මෝටර් වාහන පනත යටතේ වන එම්.ටී.ඒ. 08 ආකෘතිය වත්මන් පරිහරණකරු විසින් අත්සන් කිරීම.

ඈ) මෙම පැවරීමට අදාළව කිසියම් ගාස්තු ගෙවීමක් අවශ්‍ය වන්නේ නම් එම වියදම් වත්මන් පරිහරණකරු විසින් දැරීම.

03. ගර්හිත වාහන හෝ අබලි වාහන ලෙස අපහරණය කිරීමට නියමිත වාහන වල නීත්‍යානුකූල අයිතිය පිළිබඳ ගැටලු පවතින අවස්ථාවල දී එවැනි වාහන අපහරණය කිරීමට පෙර ඉහත ක්‍රියාවලිය අනුගමනය කරමින් අදාළ ආයතනය විසින් ලියාපදිංචි අයිතිය ලබාගත යුතු අතර ඒ සමඟ ම එම වාහනයේ ලියාපදිංචිය අවලංගුකිරීමේ (deregistration) ක්‍රියාවලිය ද සිදු කළ යුතු ය.

04. ඉහත සඳහන් 02 හා 03 වගන්ති යටතේ වන උපදෙස් අනුව 2019 මාර්තු 31 වන දිනට පෙර වාහන වල ලියාපදිංචි අයිතිය පිළිබඳ එවැනි ගැටලු නිරාකරණය කර ගැනීමට රජයේ සියලු ම ආයතන කටයුතු කළ යුතු වේ.

05. මේ සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කරගැනීම් අවශ්‍ය වන්නේ නම්, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයෙන් විමසිය හැකි වේ.

කොම්ප්ට්‍රොලර් ජනරාල්,
කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

දුරකථන අංකය: 011 - 2151425
ෆැක්ස් අංකය: 011 - 2151417

06. රජයේ වත්කම් කළමනාකරණය රජයේ නිලධාරීන් විසින් ඉටුකළ යුතු ප්‍රමුඛ කාර්යයක් වන බැවින් ඉහත සඳහන් උපදෙස් අනුගමනය කරන ලෙස සියලු ම රාජ්‍ය ආයතන වෙත කාරුණිකව දන්වමි.

**ඒ. ආර්. දේශප්‍රිය**
**භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්**

පිටපත්:

1. විගණකාධිපති
2. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්

## වාහනයේ භාරකාරීත්වය හා භාවිතය පිළිබඳ වගකීම සහතික කිරීමේ ආදර්ශ ලිපිය

කොම්ප්ට්‍රොලර් ජනරාල්,

කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය,

මහා භාණ්ඩාගාරය,

කොළඹ 01.

**<u>වාහනය භාවිතය හා භාරකාරීත්වය පිළිබඳ වූ වගකීම</u>**

2018.10.10 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 03/2018 හි 2 (අ) ඡේදයේ නියමය අනුව ................................ (වාහනයේ ලියාපදිංචි අංකය) අංක දරණ මෝටර් රථයේ භාවිතය සම්බන්ධයෙන් සියලු වගකීම් දැරීමට අදාලව ය.

02. .................................................... (වාහනයේ ලියාපදිංචි අංකය) අංක දරණ වාහනය ................................(දිනය) සිට මේ දක්වා .............................................................................. (අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය) භාවිතා කරන ලද බවත්, නීත්‍යානුකූල ලියාපදිංචි අයිතිය පවරන දිනය දක්වා එකී වාහනය භාවිතයට සහ එහි භාරකාරීත්වයට අදාල සියළු වගකීම් මෙම ආයතනය විසින් දරණු ලබන බවත් සහතික කරමි.

03. අදාළ වාහනය පිළිබඳ විස්තර

I. පෙර අයිතිකරු :

II. චැසි අංකය :

III. එන්ජින් අංකය :

......................................................................

අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා

(නිල මුද්‍රාව)